# පුංචි සුරංගනාවි



අනුදි ටරින්යා වීරකෝන්

කථාව සහ චිත්‍ර

ඩබ්ලිව්.එම් අනුදි ටරින්‍යා වීරකෝන්

2 ශ්‍රේණිය C

මහාමායා බාලිකා විදුහල

මහනුවර

කතෘ ප්‍රකාශනයකි

2023 දෙසැම්බර් මස 02 වන දින

ISBN 978-624-208-114-4

# පිදුම

කුඩාකල සිට හොඳ නරක කියාදුන් මාගේ ආදරණීය දෙමාපියන්ටත් පාසලේදී මා හට ගුරුහරුකම් කියාදෙන රේණුකා රාජපක්ෂ ගුරුතුමියටත් හදපිරි බැතියෙන් මාගේ මේ කුළුදුල් පොත පිලිගන්වමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩගැනීම අපේක්‍ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගොලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශිය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීම ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගිලි ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවිකරණයකරමින් 'දිවිය දිනන විද්‍යුත් පොතක්' ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ 'දිවිය දිනන විද්‍යුත් පොතක්' ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකල විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධිර  
විදුහල්පතිනිය  
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර  
2023.11.01

# පුංචි සුරංගනාවි

එකෝමත් එක කාලයක රැජිනක් හා රජතුමෙක් හිටියා. ඒ දෙදෙනාට ළමයි හිටියේ නැහැ. ඔහොම කාලයක් ගතවුණා. රැජිනට හා රජතුමාට පුංචි දූ කුමාරිකාවක් හමුවුණා. එම රජතුමා හා රැජින කුමරියට නමක් තැබුවා ඒ නම තමයි ‘පුංචි සුරංගනාවි’



පුංචි සුරංගනාවී දවසින් දවස ලොකු උණා. එයා හරිම ලස්සන කුමාරිකාවක් උනා. හැබැයි එයාට සෙල්ලම් කරන්න කවුරුත් හිටියේ නැහැ.



පුංචි සුරංගනාවි රජ උයනේ හැමතැනම සෙල්ලම් කරන්න කෙනෙක් හෙව්වා එයාට කවුරුත් හමුබ වුණේ නැහැ. කුමරිය හරිම දුකින් කාලය ගත කළා.



දින, සති, මාස ගෙවුණා. කුමාරිය පුංචි හා පැටියෙක් හොයා ගත්තා. එයා හරිම හුරතල් එයාගේ නම බනි. බනි පුංචි සුරංගනාවියට හරිම ආදරෙයි.



දවසක් බනි එක්ක පුංචි සුරංගනාවි සෙල්ලම් කළා.බනි කැලේට දිව්වා. එයා කවදාවත් ආපහු ආවේ නැහැ. පුංචි සුරංගනාවි හොඳටම ඇඩුවා.



පුංචි සුරංගනාවි අඩනකොට සුරංගනාවියක් එතනට ආවා.



රාත්‍රියේ මායා යෂ්ටිය පුංචි සුරංගනාවිට කතා කළා. එයින් පසු මෙහෙම කිව්වා

‘‘ අද රාත්‍රියේ මම මායාවක් මතුරනවා එයින් හෙට පුදුමයක් සිදුවෙයි’’



සුරංගනාවි පුංචි සුරංගනාවියට මෙහෙම කිව්වා.

‘‘ ඇයි ඔයා තනියම අඩන්නේ එන්න මා එක්ක සෙල්ලම් කරන්න නැතිනම් මම ඔබට යාළුවෙක් සොයා දෙන්නම්’’

සුරංගනාවි මායා යෂ්ටියක් දී එතැනින් පිට වුණා.



රාත්‍රිය නිමා වුණා. එයින් උදේ පුදුමයක් වුණා. ඇදේ පුංචි කුමාරියක් වැතිරි සිටියා මාළිගාවේ හැමෝම පුදුම වුණා. පුංචි සුරංගනාවි මායා යෂ්ටියට ස්තුති කළා මායා යෂ්ටිය සුරංගනා ලෝකයට ගියා.



පුංචි කුමරිය සතුටින් ලොකු වුණා පුංචි සුරංගනාවි පුංචි කුමරිය සමඟ සතුටින් සෙල්ලම් කළා පිය රජතුමාටයි රැජිනටයි හරිම සතුටුයි. මාළිගාවේ හැමෝම සතුටු වුනා.



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොද පතින් දුරස්වන පාසල් දරුවන් නැවත නැවත පොතපතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදි මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ත කරණයට යොමුකරණ ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හදුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ත්‍ර ප්‍රමාණයක් රචනා කරමින් වාරර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුල ගොඩනැගී ඇති ලේඛන ස්ංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රදනා කරන්නට විය. ඒ තුලින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර, ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රිය හික්මීම ප්‍රදර්ශණය කරන කැඩපතකි. මෙම නිර්මාණය රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලස්මකරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ෂවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ශාස්තු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්තකරනයට යොමුකල ව්‍යපෘතියේ නිර්මාපක

2023.11.01